1979 - 1 - 11

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1978 අංක 12 දරන සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 දෙසැම්බර් මස 5 වන දින]

---

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1978 දෙසැම්බර් මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිල : ශත 30 යි.    තැපැල් ගාස්තුව : ශත 25 යි.

1978 අංක 12 දරන සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 දෙසැම්බර් මස 5 වන දින]

එල්. ඩී.—ඕ. 48/77

**සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 1978 අංක 12 දරන සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

129 වන අධිකාරයෙහි 30අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතේ 30 වන වගන්තියට ඉක්බිතිව ම, පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 30අ වන වගන්තිය වශයෙන් බලපවත්වන්නේ ය:—

"ව්‍යාපාරයේ නම හෝ අයිතිය වෙනස් වුව ද වේතන ගෙවීමට සේවායෝජකයා යටත් වන බව.

30අ. 30 වන වගන්තිය යටතේ යම් සේවකයකුට ගෙවිය යුතු වේතනය—

(අ) යම් සාප්පුවක හෝ කාර්යාලයක ව්‍යාපාර නාමයේ වෙනසක් ඇති වී තිබුනේ වුව ද ඒ සේවකයාගේ සේවායෝජකයා විසින් ගෙවිය යුතු ය;

(ආ) යම් සාප්පුවක හෝ කාර්යාලයක අයිතියේ වෙනසක් ඇති වී තිබුනේ වුව ද ඒ සේවකයාගේ අලුත් සේවායෝජකයා විසින් ගෙවිය යුතු ය:

තව ද එවැනි යම් වේතනයක් ගෙවීම පැහැර හැරීමක් සිදු වී ඇති අවස්ථාවක 52 වන වගන්තියේ විධිවිධාන අදාළ වන්නේ ය.".

50ඇ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

**3.** (1957 අංක 60 දරන පනතින් ඇතුළත් කරන ලද) 50ආ වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 50ඇ වන වගන්තිය වශයෙන් බලපවත්වන්නේ ය:—

"යම් ලේඛනයක් හෝ සටහනක් පවත්වා ගෙන යාම සේවායෝජකයකු විසින් පැහැර හැර ඇති අවස්ථාවක වේතන අය කර ගැනීම.

50ඇ. (1) යම් සේවකයකුට ගෙවිය යුතු යම් වේතනයක් ගණන් බැලීමේ කාර්යයන් සඳහා අවශ්‍ය වන්නා වූ ද තබා ගැනීමට හෝ පවත්වා ගෙන යාමට මේ පනතින් හෝ මේ පනත යටතේ නියමිත වූ ද යම් ලේඛනයක් හෝ වාර්තාවක් තබා ගැනීම හෝ පවත්වා ගෙන යාම සේවායෝජකයකු විසින් පැහැර හැර ඇති අවස්ථාවක හෝ පරීක්ෂා කිරීම හෝ සෝදිසි කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට එම ලේඛනය හෝ වාර්තාව ඉදිරිපත් කිරීම සේවායෝජකයකු විසින් පැහැර හරින අවස්ථාවක, ඒ

ඡ 37289-14,025 (78/12)

සේවකයාට ගෙවිය යුතු අඩුවෙන් ගෙවා ඇති යම් වේතන මුදලක ප්‍රමාණය කොමසාරිස්වරයාට ලබා ගත හැකි සියලු වාචික හා ලේඛනමය සාක්ෂි පදනම් කොටගෙන ගණන් බැලීමට කොමසාරිස්වරයාට මෙයින් බලය පවරනු ලබන අතර එවැනි යම් වේතනයක් ගෙවීම සම්බන්ධයෙන් පැහැර හැරීමක් සිදු වී ඇති අවස්ථාවක (2) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වේතන වශයෙන් යම් මුදලක් ගෙවීමට යටත් සේවායෝජකයකු එම මුදල ගෙවීම පැහැර හරින්නා වූ ද එම මුදල මේ පනතේ වෙනත් යම් විධිවිධාන යටතේ අය කර ගැනීම කළ නොහැකි හෝ අයෝග්‍ය බව කොමසාරිස්වරයාගේ මතය වන්නා වූ ද අවස්ථාවක එසේ ලැබිය යුතු මුදල පිළිබඳ විස්තර ද ඒ පැහැර හැරීම කර ඇති සේවායෝජකයාගේ නම සහ පදිංචි ස්ථානය ද දක්වෙන සහතිකයක් කොමසාරිස්වරයා විසින් ඒ ස්ථානය පිහිටා ඇති කොට්ඨාසය විෂයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත නිකුත් කරනු ලැබිය හැකි ය. එවිට මහෙස්ත්‍රාත්වරයා, ලැබිය යුතු මුදල අය කර ගැනීම සඳහා සේවායෝජකයාට විරුද්ධව වැඩිදුර නඩු කටයුතු පවත්වා ගෙන නොයා යුත්තේ කුමක් නිසාදැයි හේතු දැක්වීම පිණිස ඒ සේවායෝජකයා තමා ඉදිරියට කැඳවිය යුතු අතර සෑහෙන හේතු දැක්වීම පැහැර හරිනු ලැබූ විට ගෙවීම පැහැර හැර ඇති මුදල ඒ සේවායෝජකයා වෙත ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරන ලද දඩයක් ලෙස සලකනු ලැබිය යුතු අතර එය එපරිද්දෙන් අය කර ගනු ලැබිය යුතු ය. එසේ අය කර ගනු ලැබූ සෑම මුදලක් ම කොමසාරිස්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා, කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන සහතිකයක ඇති යම් ප්‍රකාශයක නිරවද්‍යතාව මේ වගන්තිය යටතේ වූ යම් කටයුත්තක දී අධිකරණය විසින් ප්‍රශ්න කිරීම හෝ එහි නිරවද්‍යතාව පරීක්ෂා කිරීම නොකළ යුතු ය; තවද ඒ අනුව, ඒ සහතිකයේ ඇති යම් ප්‍රකාශයක නිරවද්‍යතාව ගැන සලකා බැලීමට හෝ ඒ ගැන තීරණයක් දීමට මේ වගන්තියේ කිසිවකින් අධිකරණයට බලය දෙනු නොලබන අතර පැහැර හැරීම කර ඇති සේවායෝජකයාගෙන් (1) වන උපවගන්තිය යටතේ ලැබිය යුතු මුදල් ප්‍රමාණය යථා පරිදි ගණන් බලනු ලැබ ඇති බවටත් ඒ මුදල ගෙවීම පැහැර හැර ඇති බවටත් කොමසාරිස්වරයාගේ සහතිකය ප්‍රමාණවත් සාක්ෂි වන්නේ ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියෙහි 54අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.**

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එහි 54අ වන වගන්තිය වශයෙන් බලපවත්වන්නේ ය.

**" ලේඛනය, දැන්වීම හෝ වාර්තාව පවත්වාගෙන යාම පැහැර හැරීම සම්බන්ධයෙන් දණ්ඩනය.**

54අ. තබා ගැනීමට හෝ පවත්වා ගෙන යාමට 18 වන වගන්තිය යටතේ නියමිත යම් ලේඛනයක්, දැන්වීමක් හෝ වාර්තාවක් තබා ගැනීම හෝ පවත්වා ගෙන යාම පැහැර හරින හෝ ඉදිරිපත් කරන ලෙස කොමසාරිස්වරයා විසින් හෝ යම් නියමිත නිලධරයකු විසින් 50 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ආ) ඡේදය යටතේ නියම කරනු ලැබූ ලේඛනය හෝ වාර්තාව ඉදිරිපත් කිරීම පැහැර හරින සෑම සේවායෝජයකු ම වරදක් කරන අතර—

(අ) එම වරද ප්‍රථම වරට කරන ලද වරදක් වන අවස්ථාවක රුපියල් සියයකට අඩු නොවන්නා වූ ද රුපියල් දෙසිය පනහක් නොඉක්මවන්නා වූ ද දඩයකට යටත් වන්නේ ය;

(ආ) එම වරද දෙවන වරට කරන ලද වරදක් වන අවස්ථාවක රුපියල් දෙසිය පනහකට අඩු නොවන්නා වූ ද රුපියල් පන්සියයක් නොඉක්මවන්නා වූ ද දඩයකට යටත් වන්නේ ය; තව ද

(ඇ) එම වරද තදනන්තර වරදක් වන අවස්ථාවක රුපියල් පන්සියයකට අඩු නොවන්නා වූ ද රුපියල් දහසක් නොඉක්මවන්නා වූ ද දඩයකට හෝ හය මාසයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් වන අතර ඊට අතිරේකව, වරද කරු කරනු ලැබීමෙන් පසු ඒ වරද නොකඩව කර ගෙන යනු ලබන එක් එක් දිනය වෙනුවෙන් රුපියල් පනහක් නොඉක්මවන්නා වූ දඩයකට ද යටත් වන්නේ ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.**

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත සඳහන් අලුත් වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

**" නඩු පැවරීම අනුමත කිරීම.**

**64.** කොමසාරිස්වරයා විසින් හෝ ඔහුගේ ලිඛිත අවසරය ඇතිව මිස සහ වරද සිදු කිරීමෙන් හය අවුරුද්දක් ඇතුළත මිස මේ පනත යටතේ වූ යම් වරදක් සඳහා කිසිදු නඩු පැවරීමක් නොකළ යුතු ය.".